**පාතහේවාහැට ප්‍රාදේශීය සභාව.**
**මහනුවර දිස්ත්‍රික්කය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන.

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 30 දින ද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 10 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 මතය.

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට පාතහේවාහැට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

සභාව සතු පොදු සුසාන භූමි, පොදු ළිං, වැසිකිළි, ප්‍රජාශාලා හා සමිති ශාලා 400 ක් පමණ පිහිටි ස්ථාන වල අගය තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

#### 1.3.2 නොසැසඳූ පාලන ගිණුම්.

සේවක ණය පාලන ගිණුම් අනුව ශේෂය රු.2,617,650 ක් වූ අතර, උපයෝගී ලේඛන අනුව, ගිණුම් ශේෂය රු.2,770,510 ක් වූයෙන් රු.152,860 ක වෙනසක් නිරීක්ෂණය විය.

#### 1.3.3 ලැබිය යුතු ගිණුම්

2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 05 ක එකතුව රු.50,472,078 ක් වූ අතර, එයින් අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි එකතුව රු.15,504,333 ක් වී තිබුණි.

#### 1.3.4 ගෙවිය යුතු ගිණුම්

2014 දෙසැම්බර් 31 දිනට ගෙවියයුතු ගිණුම් ශේෂ 02 ක එකතුව රු.34,428,181 ක් වූ අතර, එයින් අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂවල වටිනාකම රු.3,074,343 ක් වී තිබුණි.

**1.3.5 නීති රීති රෙගුලාසි වලට අනුකූල නොවීම.**

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

| | නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත. | |
| | 134 වන වගන්තිය | 2008 වර්ෂයෙන් පසුව සංවර්ධනය කළ ප්‍රදේශ හදුනා ගෙන වරිපනම් බදු අය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාව. | |
| | 177 හා 178 රීති | ටෙන්ඩර් ක්‍රියා පරිපාටිය අනුගමනය කිරීමකින් තොරව රු.18,168,487 කි වටිනා කර්මාන්ත 120 ක ඉදි කිරීම් ප්‍රජා පාදක සංවිධාන වෙත පවරා තිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහය. | |
| | xxiv වැනි පරිච්ඡේදයේ 4.4 හා 4.5 වගන්ති. | ස්ථාන මාරු වී ගිය, මිය ගිය, වැඩ තහනම් කළ හා සේවය අත හැර ගිය නිලධාරීන් හා සේවකයින් 07 දෙනෙකුගෙන් දීර්ඝ කාලයක සිට අය නොවු රු.44,725 ක ණය ශේෂයක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.19,491,520 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.29,929,587 ක් වූයෙන් අතිරික්තයේ රු.10,438,067 ක අඩුවීමක් දක්නට ලැබුණි.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 වරිපනම් බදු**

(අ) සමාලෝචිත වර්ෂය ආරම්භක දිනට රු.6,154,106 ක් හිග ශේෂයක් පැවති අතර, බිල් කිරීම් රු.2,434,573 ක් විය. මෙම ශේෂයන්ගෙන් වර්ෂයේ අය කිරීම් ප්‍රතිශතය පිළිවෙළින් සියයට 50 ක් හා සියයට 56 ක් වූයෙන්, සමාලොචිත වර්ෂයේ අවසාන දිනට හිග වරිපනම් බදු ශේෂය රු.4.274,748 ක් විය. එයින් වසරක් ඉක්මවා තිබු රු.3,039,513 ක හිග ශේෂයන් අය කර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1) වගන්ති ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) අක්කර බදු.

--------------

සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට පැවති රු.1,023,444 ක හිග ශේෂය වර්ෂ ගණනාවක සිට පැවත එන අතර, එම හිග ශේෂයන් අය කර ගැනීම සඳහා විධිමත් ක්‍රියාමර්ගයක් අනුගමනය කර නොතිබුණි.

**2.2.2 කඩකුලී ආදායම**

-----------------

සභාව සතු කඩකාමර බදුදීමෙන් සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට වූ රු.389,836 ක හිග ශේෂය අයකර ගැනීමට විධිමත් ක්‍රියාමර්ගයක් අනුගමනය කර නොතිබුණි.

**2.2.3 ජල ගාස්තු**

-----------

(අ) සභාව සතු ජල ව්‍යාපෘතියට අදාළව ජල පාරිභෝගික සංඛ්‍යාව 3424 ක් වුවත්, ජලමනු සවි කර තිබුණේ පාරිභෝගිකයන් 819 ක් සඳහා පමණි.

(ආ) නිසි පරිදි ජල ගාස්තු අය නොකිරීම හේතුවෙන් 2014 දෙසැම්බර් 31 දින වන විට රු.7,570,521 ක හිග ශේෂයක් පැවති අතර, ඒ සඳහා ජල පාරිභෝගිකයින් සමග එළඹි ගිවිසුමේ 02 (iv) ඡේදය ප්‍රකාරව කටයුතු කර හිග මුදල් අය කර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

---------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේක්ම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ හා මුද්දර ගාස්තුවල වටිනාකම රු.20,337,089 ක් වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

----------------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2012, 2013 හා 2014 වර්ෂයන්හි අනවසර ඉදි කිරීම් 63 ක් පමණ සිදු කර තිබුණ ද, ඒ සම්බන්ධයෙන් නීත්‍යානුකූලව කටයුතු කර නොතිබුණි.

(ආ) සභාවේ අනුමත කාර්යය මණ්ඩලයේ පුරප්පාඩු 34 ක් පැවති අතර, එම පුරප්පාඩු සම්පූර්ණ කර නොතිබීම හේතුවෙන්, නිලධාරීන් විසින් විෂයයන් කීපයක වැඩ ආවරණය කරන බවක් නිරීක්ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.7,570,521 ක හිග හිටි ජල ගාස්තු ශේෂය තුළ සාවද්‍ය ලෙස බිල් කරන ලද රු.1,123,120 ක අය නොවන ශේෂයක් පැවතිණි. මේ සම්බන්ධව 2013 වර්ෂයේ විගණකාධිපති වාර්තාවෙන් පෙන්වා දී ඇතත්, නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

**3.2 නිෂ්ක්‍රිය හා ඌණ උපයෝජිත භෞතික සම්පත්**

----------------------------------------------

2013 වර්ෂයේදි රු.300,000ක මුදලක් වැයකර කොන්ක්‍රීට් කුළුණු යොදා කොන්ක්‍රීට් වහළය දක්වා පමණක් ඉදිකරන ලද නුගලියද්ද ප්‍රජා ශාලාවේ ඉතිරි වැඩ සම්පූර්ණ කර නොතිබීම හේතුවෙන්, විගණන දින වූ 2015 ජූනි 20 දින වන විටත් ප්‍රයෝජනවත් කාර්යයකට යොදවා නොතිබුණි.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

-------------------------

මොරගොල්ල බහුකාර්යය ගොඩනැගිල්ල රු.643,656ක මුදලක් වැයකර ඉදිකිරීම් කටයුතු නිම කර ඇතත්, ගොඩනැගිල්ලේ උඩුමහලය වැසිකිළි පහසුකම් සකසා නොමැති අතර පොළව ටයිල් කිරීමක් හෝ බිත්ති සුද බැදීමක් හෝ කර නොතිබුණි.

**4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

-----------------------------------------

**4.1 අයවැය පාලනය**

------------------

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛණයට අනුව ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තත්‍ය ආදායම් හා වියදම් සමඟ සැසැඳීමේදී ආදායම් විෂයයන් 07 ක සියයට 12 සිට සියයට 77 දක්වාද වියදම් විෂයයන් 08 ක සියයට 12 සිට සියයට 100 දක්වාද විචලනයන් නිරීක්ෂණය වූ බැවින්, අයවැය ලේඛණය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

**4.2 ප්‍රසම්පාදන සැලැස්ම**

----------------------

සභාවේ මිලදී ගැනීම් හා ඉදි කිරීම් සම්බන්ධයෙන් ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කර නොතිබුණි.

**4.3 විගණනය හා කළමනාකරණ කමිටු පැවැත්වීම**

--------------------------------------------------

ආයතනය තුළ විගණනය හා කළමනාකරණ කමිටු ස්ථාපිත කර නොතිබුණි.

**4.4 අභ්‍යන්තර විගණනය**

-----------------------

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**5. පද්ධති හා පාලන.**

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අභ්‍යන්තර විගණනය.

(ඇ) ආදායම් පරිපාලනය.

(ඈ) වත්කම් කළමනාකරණය

(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය